**බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

**-----------------------------------------------------------------------**

බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (OFID) සහ සවුදි සංවර්ධන අරමුදල (SFD) අතර 2015 ජූනි 26 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹී අංක 1661 පී සහ 10/639 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

**-----------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, පේරාදෙණිය බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කි.මී. 147 ක මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීම මඟින් මධ්‍යම හා ඌව පළාත් සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා ප්‍රවාහනය වැඩිදියුණුකිරීම සහ එම පළාත්වල ආර්ථික කටයුතු ඉහළ නැංවීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,200 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 140 ක් සහ එයින් රු.මිලියන 15,600 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 120 ක් ඔපෙක් අරමුදල සඳහා වූ ජාත්‍යන්තර සංවර්ධන අරමුදල සහ සවුදි සංවර්ධන අරමුදල ඒකාබද්ධව මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සන්සන්දනය කර ඇති බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණාත්මක ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ කරන ලද ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව, සහ

**(එ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බව,

**(ඇ)** ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

**(ඈ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබූ බව, සහ

**(ඉ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ව්‍යාපෘතිය විසින් මාර්ගය වැඩිදියුණුකිරීම් කටයුතු මත ඇතිවූ ඉඩම් අත්පත් කරගැනීමේ පිරිවැය වශයෙන් එකතුව වූ රු.මිලියන 13.51 ක මුදල බිම් මැනුම් පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

### 2.2.2 නීති රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි 9.2 වගන්තිය ප්‍රකාරව, රේඛීය අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කළ නිළධරයෙකු, ජාතික සැලසුම් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නම් කළ නිළධාරියෙකු සහ ව්‍යාපෘති නියාමන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නම් කළ නිළධාරියෙකු යන අයගෙන් ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුව සමන්විත විය යුතුය. කෙසේවෙතත්, මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කමිටුව ඉහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත නොවූ අතර සලකා බලන වසර තුළ එවැනි රැස්වීම් 8 ක් පමණක් පවත්වා තිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | 2016 දෙසැම්බර් 31 දිනට |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| -ඔඑෆ්අයිඩී | 60 | 7,800 | - | - | - |
| -එස්එස්ඩී | 60 | 7,800 | 135 | - | - |
| ශ්‍රී ලංකා රජය | 20 | 2,600 | 500 | 344.20 | 768.50 |
| එකතුව | 140 | 18,200 | 635 | 344.20 | 768.50 |

**3.2 භෞතික ප්‍රගතිය**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** භෞතික ප්‍රගතිය සියයට 33 සිට සියයට 53 ක පරාසයක් තුල ළඟා කර ගැනීමට 2016 දෙසැම්බර් 31 වන විට බලාපොරොත්තු වී තිබුණද ලබාගත හැකිවූ තොරතුරු අනුව, මාර්ගය වැඩිදියුණුකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. ඉඩම් අත්පත්කරගැනීමේ ප්‍රගතිය බලාපොරොත්තු වූ ඉලක්ක වලට බොහෝ පිටුපසින් තිබුණු අතර එය මාර්ගය පුනුරුත්ථාපනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමට බලපානු ඇත.

**(ආ)** ප්‍රධාන කාර්යමණ්ඩලයේ වගකීම් හා ව්‍යාපෘතිය ළඟාකරගැනීමට අවශ්‍ය භෞතික හා මූල්‍ය ඉලක්ක නිශ්චිතව හඳුනාගත් විස්තීර්ණ සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ අරමුණු ඵලදායී හා කාර්යක්ෂම ලෙස නිවැරදි මිනුම් ක්‍රම අනුව අරමුණු ළඟා කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කාර්යසාධනය සමස්ථයක් ලෙස ගත් කල මැනීමට හා ඇගයීම කල නොහැකි වි තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** උපයෝගී සේවාවන් (Utility services) වෙනස්කිරීම සඳහා රු.මිලියන 329.20 ක මුදලක් ද ඇතුළුව රු.මිලියන 689.05 ක මුදලක් 2016 දෙසැම්බර් 31 වන විට ගෙවා තිබුණු අතර ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ බිබිල ප්‍රාදේශීය සභාව වැනි වෙනත් රාජ්‍ය ආයතන විසින් 2017 මැයි 31 වන විටත් එම වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ආ)** මාර්ග සංවර්ධන අධිකාරියෙහි මහනුවර පිහිටි සැලසුම් කාර්යාලය විසින් මෙම මාර්ග කොටස්හි ජ්‍යාමිතික නිර්මිතයන් කිරීම සඳහා ගිවිසුමකින් තොරව භාරගෙන තිබුණි. කෙසේවුවත්, මුළු එකතුව රු.මිලියන 5.62 ක අතුරු ගෙවීම්, සැලසුම් කාර්යාලය විසින් තෝරාගත් උපකොන්ත්‍රාත්කරුවන්ගේ නම් වලට ඍජුවම ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------**

ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම පිණිස නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරු දෙදෙනෙක්, ව්‍යාපෘති ඉංජිනේරුවරයෙක් සහ ව්‍යාපෘති ලේකම්වරයෙක් බඳවාගැනීමට 2016 දෙසැම්බර් 31 වන විටත් ව්‍යාපෘතිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.